# මුහුණට මුහුණ

## ශ්‍රීනාත් මද්දුමගේ




**ශ්‍රීනාත්**
අද එකතුවෙන්නෙ විවිධ ක්ෂෙත්‍රයන්හි දස්කම් පෑ අපේ කලාකරුවෙක්. විටෙක ඔහු නිවේදකයෙක්. ගුවන් විදුලි ශිල්පියෙක්. විටෙක රංග ශිල්පියෙක්. නාට්‍ය අධ්‍යක්ෂවරයෙක්. පසුතල දර්ශණ නිර්මාණ ශිල්පියෙක්. ඔහු තමයි ගාමිණී රණසිංහ...

**ගාමිණී.**
ඔය හැම දේම පොඩ්ඩ පොඩ්ඩ කරන මනුස්සයෙක් මම. හැබැයි මම ඔය සියළු දෙයින්ම පෞද්ගලික වින්දනයක් ලබනවා.

**ශ්‍රීනාත්**
කලාවට යොමු වුණේ කොහොමද?

**ගාමිණී.**
ඇත්තටම මුලින්ම යොමු වුණේ ජර්මාණු කාර්මික අභ්‍යාස විද්‍යාලයෙන් කිව්වොත් නිවැරදියි.

**ශ්‍රීනාත්**
කාර්මික විද්‍යාලයෙන් ඉගෙන ගත්තෙ කාර්මික දැනුම විතරක් නෙවෙයි ද?

**ගාමිණී.**
කාර්මික දැනුම තමයි... කාර්මික දැනුම පමණක් නොවෙයි මනුස්සයෙක් සම්පූර්ණ වෙව්න නම් කලාව සාහිත්‍යයත් ඕනෙ ඒ ගැන තේරුම් ගත් අපේ ආචාර්යවරු අපව කලාවට, සාහිත්‍යයට යොමු කරවර්න යම් යම් වැඩ සටහන් දියත් කළා.. ඉතින් එහි පවත්වන කලා උළෙලට මමයි විජේකෝන් සහ විජේසිංහ කියලා යාලුවො දෙන්නෙක් එකතු වෙලා විවිධ නිර්මාණ ඉදිරිපත් කළා.. ඔවුන් දෙදෙනාත් හොඳ රංග ශිල්පීන් දෙදෙනෙක්.. අපි කරපු රංගන ඉතාම ජනප්‍රිය වුණා.. ඒ විතරක් නෙවෙයි මම අධ්‍යාපනය ලැබුවේ ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයේ.. මම ශිෂ්‍ය භට කණ්ඩායම හා ක්‍රීඩා කණ්ඩායම නියෝජනය කළා.. එම කණ්ඩායම් වල පැවැත්වූ විවිධ ප්‍රසංග වලදී මම කෙටි රංගන ඉදිරිපත් කළා..

**ශ්‍රීනාත්**
එතකොට මුල්ම ප්‍රසිද්ධ වේදිකාව මෙහෙද?

**ගාමිණී.**
ඔව් ශ්‍රීනාත්.. මම මුලින්ම සම්බන්ධ වුණේ ගුවන් විදුලියට.. එහි ළමා ගුවන් විදුලි වැඩ සටහන් වලට ශිල්පියෙක් හැටියට සම්බන්ධ වෙන්න මට අවස්ථාව උදාකරදුන්නේ අරවින්ද... ඔහු මාව ගුවන් විදුලියට සම්බන්ධ කරගත්තා.. ඊට පස්සෙ මට විශාල පිටුවහලක් ලබා දුන්න අප අතර නැති ඒකනායක අංකල් මේ අවස්ථාවෙදි මතක් කරන්න ඕනෙ.. ඒ එක්කම උපා උපදාස, බන්දු දිසානායක, අරවින්ද රූපසිංහ ඔවුන්ගෙ ගුන්විදුලි වැඩ සටහන් වලට මාව සම්බන්ධ කර ගත්තා.. එයින් මම ගුවන් විදුලි ශිල්පියෙක් වුණා.. ඒ එක්කම මුලින්ම රෝහණ කරුණාරත්න නිර්මාණය කළ ගොන් කවඩි නාට්‍යයට මාව සම්බන්ධ කර ගත්තා. ඉන් පස්සෙ මේ වෙලාවෙ විශේෂයෙන් මතක් කරන්න ඕනෙ මාලිනී ජයසිංහ හා ශ්‍යාමෙන් ජයසිංහ මාව ඔවුන් නිස්පාදනය කරන නාට්‍ය වලට සම්බන්ධ කරගත්තා. මෙහි නාට්‍ය කලාවේ යම් පුනරුදයක් ඇතිවී තිබේද මෙයට මූලිකව කටයුතු කළේ මාලිනී ජයසිංහ හා ශ්‍යාමෙන් ජයසිංහ බව අප අමතක කළ යුතු නැහැ...

**ශ්‍රීනාත්**
ඔබ රඟ පෑ නාට්‍ය මොනවාද?

**ගාමිණී.**
ගොන් කවඩි, හුණුවටයේ කතාව, දූවිලි, මහාසාර, ඇගමෙම්නන්, ඇතුලු තවත් නාට්‍ය කීපයක්..

**ශ්‍රීනාත්**
මෙහි පළමුවෙනි ඒක පුද්ගල ගී ප්‍රසංගයේ නිවේදකයා ඔබ නේද..?

**ගාමිණී.**
ඔව් ශ්‍රීනාත්.. රෝහණ කරුණාරත්න තමයි මෙහි පළමු ඒක පුද්ගල ප්‍රසංගය පැවැත්වූවෙ. එම ප්‍රසංගයේ නිවේදක කටයුතු බාර වුණේ මට යි...

**ශ්‍රීනාත්**
පසුතල නිර්මාණ වලට පෙළඹුනේ?

**ගාමිණී.**
මම මුලින්ම කිව්වා වගේ ජර්මානු කාර්මික විද්‍යාලයේ ආදි ශිෂ්‍යයන් ඉදිරිපත් කරන ගිම්හාන රංගන ප්‍රසංගයට මම මුලින්ම වේදිකා නිර්මාණයක් කළා.. ඉන් පසුව හුඟාත් ප්‍රසංග වල මගේ අතින් නිර්මාණය වුණ පසුතල දර්ශණ ඉදිරිපත් වුණා...

**ශ්‍රීනාත්**
ඒ එක්කම මෑතකදී නිර්මාණය වුණ නෙතඟ නිලුපුල් ප්‍රසංගයට අපූරු පසුතල නිර්මාණයක් ඔබ අතින් නිමැවුණ බව අප දැක්කා.

**ගාමිණී.**
වරුණ සාවින්ද ඇවිල්ලා මා එක්ක සාකච්ඡා කරලා ඔහුගේ ප්‍රසංගයට අවශ්‍ය පසුතල නිර්මාණය මෙසේ විය යුතු යයි කිව්වා.. ඊට පස්සෙ ඒ ගැන මම ටිකක් හිතුවා... ඒ විතරක් නෙවෙයි අපි දෙන්නා ඒ අවශ්‍ය පරිසරය දැනෙන තැන් වලට පවා ගිහින් අධීක්ෂණය කලා.. ඔහුගේ නිර්මාණයට සරිලන ඔහුට අවශ්‍ය පසුතලය අඩු වියදමකින් මා අතින් නිර්මාණය වුණා... මම හැම තිස්සෙම පසුතල නිර්මාණයක් කරනකොට ඒ නිර්මාණය අවශ්‍ය තැනත්තා හෝ කන්ඩායම සමග සාකච්ඡා කරලා ඔවුන්ගේ අදහස් උදහස් අනුව නිර්මාණය කරන්න මම උත්සාහ කරනවා.. කවුරු හෝ මම නිර්මාණය කළ පසුතල නිර්මාණයකට ප්‍රසංසා කරනවා නම් මම අභිංහකව ඒ ගැන සතුටු වෙනවා.. ඒ එක්කම අඩුපාඩුවක් කිව්වොත් ඒ ගැනත් සැලකිලිමත් වෙනවා..

**ශ්‍රීනාත්**
ඔබ කොහෙන්ද මේ සියල්ල ඉගෙන ගත්තෙ.. කව්ද ඔබේ ගුරුවරයා..?

**ගාමිණී.**
ඇත්තම කියනවා නම් ශ්‍රීනාත් මං මේ සියළු දේවල් ඉගෙන ගත්තෙ ස්වයං අධ්‍යයනයෙන්. සහ ස්වයං විවේචනයෙන්..

**ශ්‍රීනාත්**
ඔබ මෙහි නාට්‍ය කීපයකුත් අධ්‍යක්ෂණය කළා නේද?

**ගාමිණී.**
මම කෙටි නාට්‍ය කීපයක් නිර්මාණය කළා.. මම නිර්මාණය කළ කොන්ත්‍රාත්තුව කෙටි නාට්‍යයට හොඳ ප්‍රේක්ෂක ප්‍රතිචාරයක් ලැබුණා.. ඉදිරියටත් කෙටි නිර්මාණ කිපයක් කරන්න බලාපොරොත්තු වෙනවා..

**ශ්‍රීනාත්**
ඔබගේ නිර්මාණ වලට පවුලෙන් ලැබෙන දායකත්වය කොහොමද?

**ගාමිණී.**
ඇත්තටම හොඳ සහයක් මට මගේ බිරිඳ සුමේධාගෙන් ලැබෙනවා.. ඒ එක්කම මගේ දරුවන් නුවන්, නලිනි, මගේ හැම නිර්මාණයකටම උපකාර වෙනවා.. ඒ එක්කම මගේ නිර්මාණ හොඳ නරක අගයනවා..

**ශ්‍රීනාත්**
දරුවන්ව කලාවට සාහිත්‍යයට යොමු කරවන්න බලාපොරොත්තුවික නැද්ද..?

**ගාමිණී.**
මම වැඩිපුරම කලාවට සාහිත්‍යයට දරුවන් යොමු කරන්න උත්සාහ කරනවා.. මොකද මෙහි ජීවත්වන හුඟක් දරුවන් කොම්පියුටර් තාක්ෂණ සංස්කෘතියත් එක්ක බද්ධ වෙලයි ඉන්නෙ.. මෙය නරක නැහැ.. නමුත් මෙහි සීමාවක් තියෙන්න ඕනෙ.. කලාත්මක නිර්මාණ වලට සම්බන්ධ වෙන්නෙ නැත්නම් ගීතයක් අහන්නෙ නැත්නම්, නාට්‍යයක් නරඹන්නෙ නැත්නම්, ඉගෙනීම කෙසේ වෙතත් හොඳ මනුස්සයෙක් වෙන්නෙ නැහැ.. ඒ නිසා මෙහි ජීවත් වන දෙමව්පියනුත් තමන්ගේ දරුවන් කලාවට සාහිත්‍යයට යොමු කරවන්න කියලා මම ඉල්ලා සිටිනවා..

**ශ්‍රීනාත්**
ඔබට උදව් කළ අය කව්ද?

**ගාමිණී.**
මම මුලින් මතක් කරන්න ඕනෙ ජේ එම් ඊ ප්‍රනාන්දු.. ඔහු තමයි මුලින්ම කිවවේ දැන් නිකම් ඉන්න එපා.. නිර්මාණ වලට එකතු වෙන්න කියලා.. ඒ එක්කම මම මුලින් සඳහන් කළ සියළු දෙනාමත් තවත් හුඟක් අයත් මගේ නිර්මාණ ශක්තිය වැඩි කරගන්න උදව් කළා.. ඒ අයට බොහොම පින්..

ලිපිනය
17 Darcy Niland Crescent
Lyndrook Vic 3975 Australia

## යමක වග්ග 15




ඉධ සෝචති පෙච්ච සෝචතී-
පාපකාරී උභයත්ථ සෝචතී
සෝ සෝචතී සෝ විහන්නතී-
දිස්වා කම්ම කිලිට්□මත්තනෝ

පව් කළ අය මෙලොව පරලොව
දෙකෙහිම ශෝකයටද පසුතැවීමටද පැමිණේ.
අවසන් මොහොතේදී වෙහෙසටද පැමිණේ,
තමා කළ ඒ කිළිටි කම් දැක.

Idha sochati pechcha sochati
papakari ubhayattha sochati
So sochati so vihannati
disva kamma kilitthamatiano

Here he grieves, hereafter he grieves.
In both states the evil-deer grieves.
He grieves , he is afflicted,
perceiving the impurity of his own deeds.

### චුන්ද සූකරික ඌරු වැද්දා පිළිබඳව

සැවැත් නුවර ජේතවනාරාමය අසලම චුන්ද සූකරික නම් ඌරන් මරා විකුණමින් දිවිගෙවන වැද්දෙක් විසී ය. ඔහු රැකෙන්නේ ඌරන් ඇතිකොට විකුණා මුදල් ඉපයීමෙන් ය. ඌරන් ඇති කරන කොටුද ගේ අසලම පිහිටා තිබේ. තම අඹුදරුවන් සමඟ ඌරන් මරා මසට විකිණීමත්, ආහාරයට ගැනීමත් දවස් පාසා කෙරේ. ඌරකු මරණයට පෙර කණුවක බැඳ මස ඉදිමීම සහ ඝන කිරීම සඳහා සතරැස් මුගුරකින් තලයි. පසුව බඩ පිරිසිදු කිරීම සඳහා කට ඇර පැහෙන උණුවතුර කටට වක්කිරීමෙන් බඩ මල සෝදා හරී. සම පහසුවෙන් ඉවත් කිරීමට ඇඟටද අර පැහෙන උණුවතුර වක්කෙරේ. පසුව ඒ සතාගේ බෙල්ල කපා මරා දමයි. මෙසේ මරන සතුන්ගේ මස් විකිණීම ද, සහ අඹුදරුවන් සමඟ කෑමද කෙරේ.

ජේතවනාරාමයෙහි බුදු හිමියෝ වැඩ වෙසෙති. සැදැහැතියෝ වෙහෙරට ධිදේ සවස පැමිණෙති. සිල් රැකීම් දන්පින් දීම් නිබඳව කෙරේ. ඌරු වැද්දා ඒ කිසිවකටවත් නොඑයි. ඔහුට වෙහෙරෙහි නැගෙන සාදු හඬද මහා කරදරයකි. පනස් පස් වසරක්ම සත්ව ඝාතනයේ යෙදී සිටි මේ වැද්දා මුදා ගැනුමට කිසිවෙකුටත් නොහැකි විය. අවසන හේ රෝගාතුර විය. රෝගය බලවත් විය. කළ පව් සිහිවිය. සෝකය බලවත්වී දරුණු බවට පැමිණියේය. මරණය ඉතා ළංවිය.

ජේතවනාරාමයෙහි සිටි භික්ෂූන් වහන්සේලාට දින කීපයක සිට ඌරන් මරන විට නගන මර ලතෝනිය රෑ දවල් දෙකෙහිම විටින් විට ඇසෙන්නට විය. යම් ධිත්සවයකට ඌරන් විශාල ප්‍රමාණයක් මරන්නේ යැයි එක් එක් අය කතා බහ කරන්නට විය. මේ බව බුදුහිමියන්ට ද සැල කළේය. එවිට බුදුහිමියන් ඒ අය අමතා මෙසේ වදාළ සේක. ඒ ඌරන් මරන හඬ නොවේ. ඒ ඌරන් මැරූ වැද්දා ගිලන් වී මරනාසන්න අවස්ථාවේදී නගන හඬයි. ඔහු දැන් ශෝකයෙන් තැවී වේදනාවෙන් ඌරකු ලෙස කෑ ගහනවා. ඔහුට දැන් නරකයේ ගති නිමිති පහල වෙලා තියෙන්නේ. පව් කම් කළවුන් මෙලොවත් ශෝක වී පරලොවත් අපායේ ඉපදී කම්පල ලෙසින් නිමක් නැති දුක් විඳ බොහෝ සෙයින් ශෝක වන්නේ යැයි වදාළහ.

## කවි කොළය



*තෙල් මිල දිනෙන් දින ඉහළට යන දුකට*
*එක පෝලිමට මන්තිරිවරු විපක්සයේ ර*
*ජ මැති සබාවට ආවලු කරත්තයෙන්*
*ඒ සමහරක්ටයි මේ කවි වෙඩි මුරය*

*තෙල් පිරිපහදුවෙන් ඇරගෙන පයිප්පය*
*බොර තෙල් බෙදපු හැටී ඉස්සර නොමිලේම*
*තෙල බස්සවන්නට දාලා නාස් ලණු*
*ඇද්දා නම් මොකද රජගෙට කරත්තය*

**වෙත්තසිංහ**